සියලු ම හිමිකම් ඇවිරිණි]

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය
# 12 වන ශ්‍රේණිය - 2010

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න




පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි]

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය
# 12 ශ්‍රේණිය - 2010
# ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න

ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

I පත්‍රය : කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය : කාලය පැය 02යි.
ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 6කින් 4කට පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 25 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය 100
II පත්‍රය 100
200 ÷ 2 = 100

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය - I

පැය එකයි

* සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

1. කමල්ගේ වයස අවුරුදු 35කි. ඔහුගේ සොහොයුරා සරත් ඔහුට වසරකට බාලය. දෙදෙනාගේ වයස පිළිවෙළින් ද්විමය සංඛ්‍යා මගින් පෙන්නුම් කරන්නේ කවර පිළිතුරක ද?
   (1) කමල් 100011, සරත් 100010
   (2) කමල් 100011, සරත් 100100
   (3) කමල් 100010, සරත් 100011
   (4) කමල් 100101, සරත් 100011

2. සොළොස් දශමය (hexa decimal) සංඛ්‍යා පද්ධතියේ සංඛ්‍යාංක ගණන හා ඒ සම්බන්ධව පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
   (a) සංඛ්‍යාංක 15 වන අතර "A" මගින් 11 නිරූපණය කරයි.
   (b) සංඛ්‍යාංක 16 වන අතර "A" මගින් 10 නිරූපණය කරයි.
   (c) සංඛ්‍යාංක 16 වන අතර "D" මගින් 13 නිරූපණය කරයි.
   (d) සංඛ්‍යාංක 15 වන අතර "E" මගින් 14 නිරූපණය කරයි.
   ඉහත සඳහන් ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
   (1) a හා d ය. (2) b හා c ය. (3) b හා d ය. (4) සියල්ලම ය.

3. එක්තරා තර්කන දොරටුවක (logic gate) A හා B ආදාන සඳහා ප්‍රතිදානය A+B ආකාරයෙන් දැක්විය හැක. එම තර්කන දොරටුව සම්බන්ධයෙන් පහත තොරතුරු වලින් සත්‍ය **නොවන්නේ** කුමක්ද?
   (1) ආදාන දෙක අසමාන වන විට ප්‍රතිදානය 1 වේ.
   (2) ආදාන දෙකම 1 වන විට ප්‍රතිදානය 1 වේ.
   (3) ආදාන දෙකම 1 වන විට ප්‍රතිදානය 0 වේ.
   (4) ආදාන දෙකම 0 වන විට ප්‍රතිදානය 0 වේ.

4. වේගවත්ම දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය වන්නේ,
(1) අනාවරිත ඇඹරුණු යුගල (UTP) රැහැන් ය. (2) ප්‍රකාශ තන්තු (Fibre Optics) ය.
(3) ආවරිත ඇඹරුණු යුගල (STP) රැහැන් ය. (4) සමක්ෂක (Coaxial) රැහැන් ය.

5. ස්ථානීය ප්‍රදේශ ජාලයන්හි (LAN) ප්‍රධාන වශයෙන් භාවිතා කරන රැහැන් රහිත දත්ත සම්ප්‍රේෂණ මාධ්‍යයන් වන්නේ
a - සූක්ෂම තරංග b - රේඩියෝ තරංග
c - අධෝරක්ත කිරණ d - චන්ද්‍රිකා සම්ප්‍රේෂණය
(1) a හා b පමණි. (2) a හා d පමණි. (3) b හා c පමණි. (4) c හා d පමණි.

6. මොඩමයක් සම්බන්ධයෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශනය වන්නේ, එය
(1) සෑම දත්ත සම්ප්‍රේෂණයකදීම භාවිතවන උපාංගයකි.
(2) පරිගණක කිහිපයක් සම්බන්ධ කිරීමට භාවිත වන උපාංගයකි.
(3) පරිගණකයට බාහිරින් පමණක් සම්බන්ධ කරන උපාංගයකි.
(4) දුරකථන මාර්ගය හරහා දත්ත සන්නිවේදනය කළ හැකි උපාංගයකි.

7. පරිගණක ජාලකරණයේ දී භාවිත **නොවන** උපාංගයක් වන්නේ කුමක් ද?
(1) සුපිරික්සකය (Scanner)
(2) අනුග්‍රාහකය (Server)
(3) මංමාරුව (Switch)
(4) ජාල අතුරු මුහුණත් පත (Network Interface Card)

8. පරිගණක පරිණාමයේ දී පරම්පරා අනුව වෙනස් වූ පරිගණකයේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
(a) භෞතික ප්‍රමාණය (b) විදුලි පරිභෝජනය
(c) සකසනයේ වේගය (d) තාප උත්පාදනය
පරම්පරා අනුව ක්‍රමයෙන් අඩු වී ගිය ලක්ෂණ වූයේ,
(1) a, b හා c ය. (2) a, b හා d ය. (3) a, c හා d ය. (4) b, c හා d ය.

9. පෞද්ගලික පරිගණකයක මධ්‍ය සැකසුම් ඒකකයේ අන්තර්ගතව ඇති කොටස් නම්,
(1) ප්‍රධාන මතකය සහ පාලන ඒකකය ය.
(2) අංක ගණිත හා තර්කන ඒකකය සහ ප්‍රධාන මතකය ය.
(3) අංක ගණිත හා තර්කන ඒකකය සහ පාලන ඒකකය ය.
(4) අංක ගණිත හා තර්කන ඒකකය, පාලන ඒකකය සහ ප්‍රධාන මතකය ය.

10. පහත දැක්වෙන P.Q සහ P+Q යන ප්‍රතිදාන දෙකටම සමාන අගයන් ලැබීමට නම්,

| P | Q | P.Q | P+Q |
|---|---|---|---|
| 0 | 0 | | |
| 1 | 0 | | |
| 0 | 1 | | |
| 1 | 1 | | |

(a) P හා Q ආදාන දෙකහිම අගයයන් "0" ට සමාන විය යුතුය.
(b) P හා Q ආදාන දෙකෙහිම අගයයන් "1" ට සමාන විය යුතුය.
(c) P හා Q ආදාන දෙකෙහිම අගයයන් අසමාන විය යුතුය.
ඉහත පිළිතුරු තුනෙන් සත්‍ය වන්නේ කුමක් ද?
(1) a සහ b පමණකි. (2) a සහ c පමණකි. (3) b සහ c පමණි. (4) සියල්ලම ය.

11. පරිගණක වර්ගීකරණය වන ක්‍රම කිහිපයක් පහත දැක් වේ.
(a) සුපිරි/ මහා/ මධ්‍යම/ ක්ෂුද්‍ර (b) අංකිත/ ප්‍රතිසම/ දෙමුහුම්
(c) පෞද්ගලික/ වටොර මත/ අත්ල මත (d) පොදු අභිප්‍රාය හා විශේෂ අභිප්‍රාය
ඉහත සඳහන් ක්‍රම වලින්, සියළු පරිගණක සඳහා සුදුසු වර්ගීකරණයක් **නොවන්නේ**
(1) a ය. (2) b ය. (3) c ය. (4) d ය.

[3 වෙනි පිටුව බලන්න

12. මෘදුකාංග ප්‍රධාන වශයෙන් බෙදිය හැකි ක්‍රම දෙකක් වන්නේ කුමක් ද?
    (1) මෙහෙයුම් පද්ධති මෘදුකාංග සහ සම්පාදක මෘදුකාංග
    (2) පද්ධති මෘදුකාංග සහ යෙදුම් මෘදුකාංග
    (3) අවශ්‍යතා මත සැකසූ මෘදුකාංග සහ ඇසුරුම් ගත මෘදුකාංග
    (4) විධාන රේඛා මෙහෙයුම් පද්ධති සහ චිත්‍රක අතුරු මුහුනත් මෙහෙයුම් පද්ධති

13. තොරතුරු පද්ධති වර්ගීකරණයේ දී යොදා ගන්නා ක්‍රමවේදයක් **නොවන්නේ**
    (1) අතයුරු පද්ධති හෝ පරිගණකගත පද්ධති ලෙස වර්ග කිරීම ය.
    (2) පද්ධතිවල ක්‍රියාකාරීත්වය අනුව වර්ග කිරීම ය.
    (3) කළමනාකරණයේ විවිධ මට්ටම් අනුව වර්ග කිරීම ය.
    (4) දත්ත සකස් කිරීමේ සහ සන්නිවේදනය කිරීමේ වේගය අනුව වර්ග කිරීම ය.

14. දී ඇති ගැලීම් සටහනෙහි ප්‍රතිදානය කුමක් ද?
    (1) 2 (2) 3
    (3) 4 (4) 5




15. දී ඇති ගැලීම් සටහන ඇසුරින් පහත දක්වා ඇති ප්‍රශ්න දෙක සඳහා (15-16) පිළිතුරු සපයන්න.
    ක්‍රියාවලිය (Process) හා ප්‍රතිදානය (output) පිළිවෙළින් නිරූපනය කිරීම සඳහා ගැලීම් සටහනේ දී ඇති ප්‍රකාශන මොනවා ද?
    (1) C= C-2, X= X+C
    (2) X= X+C, X මුද්‍රණය කරන්න
    (3) X මුද්‍රණය කරන්න, C= C-2
    (4) C<7, X මුද්‍රණය කරන්න




16. මෙම ගැලීම් සටහනේ අඩංගු පාලන ව්‍යුහ (control structures) මොනවා ද?
    (1) පුනරාවර්තනය (repitition), අනුක්‍රම (sequence)
    (2) අනුක්‍රම (sequence), පුනර්කරණය (iteration)
    (3) පුනර්කරණය (iteration), තේරීම (selection)
    (4) අනුක්‍රම (sequence), තේරීම (selection)

17. එක්තරා මෙහෙයුම් පද්ධතියක් නොමිලයේ බාගත (download) හැකිය. එය භාවිත කිරීම සඳහා බලපත් අවශ්‍ය නොවේ. ප්‍රභව කේත (source code) විවෘතය. මෙම මෙහෙයුම් පද්ධතිය විය හැක්කේ,
    (1) ඩොස් (DOS) ය. (2) උබුන්ටු (ubuntu) ය.
    (3) වින්ඩෝස් එක්ස් පී (Windows XP) ය. (4) මැක් ඕඑස් (Mac OS) ය.

18. පහත දැක්වෙන ඒවායින් පද්ධති මෘදුකාංගයක් (System Software) **නොවන්නේ**,
    (1) ප්‍රති වෛරස මෘදුකාංග (Antivirus Software) ය.
    (2) පැතුරුම්පත් මෘදුකාංග (Spreadsheets Software) ය.
    (3) උපක්‍රම ධාවක මෘදුකාංග (Device Drivers) ය.
    (4) මෙහෙයුම් පද්ධති (Operating Systems) මෘදුකාංග ය.

19. පෝල්ඩර (Folder) සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය වන්නේ,
(1) තැනීම හා මැකීම කළ හැකි වීම ය.
(2) වෙනත් ස්ථානයකට ගෙනයාමට හැකිවීම ය.
(3) ධාරිතාවය (Capacity) හා වර්ගය (Type) දැක ගැනීමට හැකිවීම ය.
(4) ධාරිතාවය (Capacity) නිශ්චිත අගයකට වෙනස් කර ගැනීමට හැකිවීම ය.

20. පැතුරුම්පත් (spread sheet) වැඩපතක (work sheet) ක්‍රියාකාරී කෝෂය (active cell) B3 වන අවස්ථාවක D6 ක්‍රියාකාරී කෝෂය බවට පත් කිරීමට නම්
(a) යතුරු පුවරුවේ → යතුර දෙවරක් ඔබා ↓ යතුර තෙවරක් එබිය යුතුය.
(b) යතුරු පුවරුවේ ↓ යතුර දෙවරක් ඔබා → යතුර තෙවරක් එබිය යුතුය.
(c) මූසික දර්ශකය (Mouse Pointer ), D6 කෝෂය වෙත ගෙනගොස් මූසිකයේ වම් බොත්තම එක් වරක් එබිය යුතුය.

(1) a හා b පමණක් නිවැරදි ය.
(2) b හා c පමණක් නිවැරදි ය.
(3) a හා c පමණක් නිවැරදි ය.
(4) a, b හා c යන සියල්ලම නිවැරදි ය.

21. වැඩපතෙහි C2 කෝෂය තුළ = Rank(B2,B$2:B$4) සූත්‍රය (Formula) ලියා එය C3 සිට C4 දක්වා කොපි කර ඇලවූ විට (Copy Paste) කළ විට C3 කෝෂයේ ප්‍රතිදානය වනුයේ

| | A | B | C |
|---|---|---|---|
| 1 | Students Name | Marks | |
| 2 | Saman | 50 | |
| 3 | Nihal | 60 | |
| 4 | Shan | 85 | |
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |

(1) 1 ය.
(2) 2 ය.
(3) 3 ය.
(4) 4 ය.

22.

G10 ▾ fx

| | A | B |
|---|---|---|
| 1 | Name | Points Collected |
| 2 | saman | 45 |
| 3 | nishan | 50 |
| 4 | Kamalinee | 78 |
| 5 | Iqbal | 15 |
| 6 | Rajah | 25 |
| 7 | Total | 135 |
| 8 | | |

ඉහත වැඩපතෙහි මෙහි B7 කෝෂයට =sum(B2:B6) සූත්‍රය ඇතුළත් කර ඇත්නම් B2, B3 හා B4 කෝෂවලට ඇතුළත් කර ඇති එකෙල්ල ආකාර හා දත්ත ආකාර විය හැක්කේ පිළිවෙළින්
(1) සංඛ්‍යා, වම් එකෙල්ල සංඛ්‍යා, ලේබල ය.
(2) සංඛ්‍යා, ලේබල, වම් එකෙල්ල සංඛ්‍යා ය.
(3) සංඛ්‍යා, ලේබල, වම් එකෙල්ල ලේබල ය.
(4) සංඛ්‍යා; වම් එකෙල්ල සංඛ්‍යා, වම් එකෙල්ල ලේබල ය.

23. විද්‍යුත් ඉදිරිපත් කිරීමක් (Electronic Presentation) සිදු කරන අතරතුර දී පරිගණකයේ තිරය තාවකාලිකව කළු පැහැ ගැන්වීම සඳහා කළ යුතු වන්නේ,
(1) 'N' යතුර එක් වරක් එබීම ය.
(2) 'B' යතුර එක් වරක් එබීම ය.
(3) 'W' යතුර එක් වරක් එබීම ය.
(4) 'P' යතුර එක් වරක් එබීම ය.

24. බොහෝ යෙදුම් මෘදුකාංගවල Ctrl+c සහ Ctrl+v යතුරු පුවරු කෙටිමං පිළිවෙළින් භාවිත කරන්නේ
(1) ගබඩා කර මකා දැමීමට ය. (2) කොපි කර ඇලවීමට ය.
(3) කොපි කර මකා දැමීමට ය. (4) කපා ඇලවීමට ය.

25. ලිපියක පිටුවක් සකස් කිරීමේ දී ඉම [margin] තැබීම කළ හැක්කේ පහත කුමක් භාවිතයෙන් ද?
(1) පිටු හැඩතල (Page setup) (2) මුද්‍රිත පෙර දසුන (Print preview)
(3) පිටු දාරය (Page Border) (4) පාඨ දාරය (Text Border)

26. මුද්‍රණය කිරීම සඳහා යවන ලද ලිපි කිහිපයක් මුද්‍රණය නොවීය. මුද්‍රණ කාර්යයන් අවලංගු කිරීම සඳහා ගත යුතු වඩාත් සුදුසු සහ සාර්ථකම පියවර වන්නේ
(1) මුද්‍රණ යන්ත්‍රය ක්‍රියා විරහිත කිරීමය.
(2) මුද්‍රණ පෝලිම (Print queue) විවෘත කර මකා දැමීමය.
(3) පරිගණකය ක්‍රියා විරහිත කිරීමය.
(4) අදාළ යෙදුම් මෘදුකාංගයෙන් ඉවත් වීමය.

27. දී ඇති පදයකට සාමානාර්ථ පදය සොයා ගැනුම සඳහා භාවිත කළ හැකි, වදන් සකසන මෘදුකාංගයක ඇති මෙවලම වන්නේ කුමක් ද?
(1) අක්ෂර පිරික්සනය (Spell Checker) (2) සමානාර්ථ ශබ්ද කෝෂය (Thesaurus)
(3) භාෂා පරිවර්තනය (Language Translation) (4) යා ඉරි යෙදුම (Hypernation)

28. දත්ත කළමනාකරණය සඳහා වඩාත් සුදුසු මෘදුකාංගය වන්නේ,
(1) වදන් සැකසුම් ය. (2) දත්ත සමුදාය ය. (3) පැතුරුම්පත් ය. (4) ඉදිරිපත් කිරීම් ය.

29. දත්ත සමුදායක ප්‍රාථමික වස්තුව (Primary object) ලෙස සැලකිය හැක්කේ,
(1) වගුවයි. (2) විමසුමයි. (3) පෝර්මයයි. (4) වාර්තාවයි.

30. ප්‍රක්‍රමලේඛන භාෂාවන්හි වලංගු ක්ෂේත්‍ර (field) නාමයක් වන්නේ කුමක් ද?
(1) First.Name (2) FirstName (3) First*Name (4) First/Name

31. දත්ත සමුදායක් සම්බන්ධයෙන් පහත දක්වා ඇති වගන්ති කියවා නිවැරදි පිළිතුර තෝරන්න.
(a) දත්ත සමුදායක් යනු නිශ්චිත විෂයයකට, භූතාර්ථයකට (entity) හෝ සිද්ධියකට අදාළ තොරතුරුවල එකතුවකි.
(b) ප්‍රයෝජනයට ගත හැකි එක් වගුවක්වත්, අවම වශයෙන් දත්ත සමුදායක පැවතිය යුතුම ය.
(c) වගු එකක් හෝ වැඩි ප්‍රමාණයක් පදනම් කරගෙන විමසුම්, පෝර්ම හා වාර්තා ලබා ගත හැකිය.
(1) a හා b සත්‍ය වේ. (2) a හා c සත්‍ය වේ. (3) b හා c සත්‍ය වේ. (4) a, b හා c සත්‍ය වේ.

32. පහත දැක්වෙන මෘදුකාංග අතුරින් විද්‍යුත් තැපැල් මෘදුකාංගයක් **නොවන්නේ,**
(1) මයික්‍රෝසොෆ්ට් අවුට් ලුක් එක්ස්ප්‍රස් (Micro Soft Outlook Express) ය.
(2) පෙගසස් (Pegasus) ය.
(3) ඉයුඩෝරා (Eudora) ය.
(4) ඉන්ටනෙට් එක්ස්ෆොලෝරර් (Internet Explorer) ය.

33. ඔබට අළුත් විද්‍යුත් තැපැල් පණිවිඩයක් ලැබුණු බව පරිගණක තිරය මත දැක ගත හැකි වන්නේ පහත දක්වා ඇති කුමන පිළිතුර මගින් ද?
(1) එන ලිපි පෙට්ටිය (Inbox) (2) යැවෙන ලිපි පෙට්ටිය (Outbox)
(3) ලිපි යැවීම (Send) (4) ලිපින තීරුව (Address bar)

34. අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ලබා ගැනීමට පිවිසිය යුතු විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට අදාළ වෙබ් ලිපිනය පහත දැක්වේ.
http://www.doenets.lk/result.htm
{A} {B} {C}
A, B හා C හි නිවැරදි පටිපාටිය වන්නේ,
(1) වසම් නාමය, නියමාවලිය(protocol) සහ පිටුවයි.
(2) නියමාවලිය(protocol), පිටුව හා වසම් නාමයයි.
(3) නියමාවලිය(protocol), වසම් නාමය හා පිටුවයි.
(4) වසම් නාමය, පිටුව හා නියමාවලියයි.(protocol)

35. ඊමේල් ලිපිනය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්වෙන අනු ලක්ෂණය කුමක් ද?
(1) • (2) - (3) / (4) @

36. සුදීප භාවිත කරන පරිගණකයේ ඇත්තේ ඔහුගේ මිතුරකු පෞද්ගලික භාවිතය සඳහා මිල දී ගත් මෘදුකාංගවල පිටපත්ය. මේ අනුව සුදීපගේ පරිගණකයේ ඇත්තේ,
(1) නොමිලේ ලැබුණු බලපත්‍ර ලත් මෘදුකාංගයකි. (2) නොමිලේ ලැබුණු මෘදුකාංගයකි.
(3) විවෘත හා නිදහස් මෘදුකාංගයකි. (4) නොමිලේ ලැබුණු නීති විරෝධී මෘදුකාංගයකි.

37. පරිගණක ක්‍රීඩා කිරීමට ඇල්මක් දක්වන අයෙක් ඔහුගේ පරිගණකයට වෙනම VGA පතක් අවශ්‍ය බව පවසයි..අමතර VGA පතක් ඔහුට අවශ්‍ය වීම ට වඩාත්ම වැදගත් කරුණ වන්නේ,
(1) සසම්භාවී ප්‍රවේශ මතකය ප්‍රමාණවත් නැති නිසාය.
(2) පැහැදිලි ශබ්ද ලබා ගැනීමට අවශ්‍ය නිසාය.
(3) ඉහළ මට්ටමේ සජීවීකරණ හා පින්තූර ලබා ගැනීමට ය.
(4) සකසනය වේගවත් මදි නිසාය.

38. සුදුසු ඉරියව්වකින් පරිගණකයක් භාවිත නොකිරීම නිසා වැළඳිය හැකි රෝගාබාධ වන්නේ,
(a) මැණික් කටුවේ වේදනාව (b) කොන්දේ කැක්කුම
(c) ඇසේ වේදනාව (d) ශ්‍රවනාබාධ
මින් සත්‍ය වන්නේ,
(1) a, b හා c පමණි (2) a, b හා d පමණි. (3) b, c හා d පමණි. (4) a, c හා d පමණි.

39. පහත සඳහන් දෑ අතුරින් ගෙදර භාවිතය සඳහා පරිගණකයක් මිල දී ගැනීමේ දී වඩාත් ම වැදගත් වන සාධක 3 වන්නේ කුමක් ද?
(a) සකසනයේ වේගය (b) ප්‍රධාන මතක ධාරිතාව
(c) දෘඩ දිසකයේ (Hard disk) ධාරිතාව (d) සංයුක්ත තැටි ධාවකයේ වේගය
මින් සත්‍ය වන්නේ
(1) a, b සහ d පමණි. (2) b, c සහ d පමණි. (3) a, c සහ d පමණි. (4) a, b සහ c පමණි.

40. ඔබට පරිගණක ආශ්‍රයෙන් සඟරාවක් මුද්‍රණය කර ගැනීම හා සම්බන්ධ කටයුත්තක් භාර දිය හැක්කේ,
(1) පරිගණක යෙදුම් සහකාර Computer Application Assistant (CAA) ට ය.
(2) පද්ධති විශ්ලේෂක (System Analyst) ට ය.
(3) පරිගණක ප්‍රකාශක (Desktop publisher) ට ය.
(4) ක්‍රමලේඛක (Programmer) ට ය.

* *

[7 වෙනි පිටුව බලන්න